දෙපාර්තමේන්තු චක්‍ර ලේඛණ අංක.08/2011

මගේඅංකය:-DCIA/ විවිධ/2011
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09
2011.03. 25 දින

සියලුම බන්ධනාගාර අධිකාරින්,
මූලස්ථාන අධිකාරී.

## බන්ධනාගාර ආයතන වල ආපනශාලා ගිණුම් තැබීම්.

බන්ධනාගාර ආයතන වල ආපනශාලා ගිණුම් තැබීම් මූලස්ථානයට වාර්තා නොවන බව මෙතෙක් කල පරීක්ෂණ වලදී නිරීක්ෂණය වී ඇත.

රජයේ වියදමින් මූලධන හා පුනරාවර්තන වියදම් ලැබෙන අතර ශ්‍රමය නොමිලේ ලැබෙන නමුත් බන්ධනාගාර ආයතන සුභසාධක සංගම් වලට බැර කරනු ලබන ලාභය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වේ.ආපනශාලා වල ගණු දෙණු හා ගිණුම් තැබීම් විනිවිද භාවයෙන් තිබිය යුතු වේ.

1. 2011 වසරේ ජනවාරි මස සිට බල පවත්වන පරිදි සෑම වර්ෂයකම අර්ධ වාර්ෂික ගිණුම් එම වර්ෂයේ ජූලි 15 දිනට පෙරද අවසාන ගිණුම් ඊළග වර්ෂයේ ජනවාරි 15 දිනට පෙරද සකස් කර බන්ධනාගාර මූලස්ථානයේ අභ්‍යන්තර විගණන අංශය වෙත එවිය යුතුයි.

2. සෑම අර්ධ වාර්ෂික හා වාර්ෂික ගිණුමකම ආදායම, වියදම මාසිකව පෙන්විය යුතුයි.

3. දෛනිකව ආදායම හා වියදම ලේඛණයක සටහන් කල යුතු අතර එහි විකුණුම් හා මිලට ගැනීම් මුදලට හා ණයට ලෙස වෙනම හදුනාගත හැකි පරිදි සටහන් තැබිය යුතුයි.

4. ණයට විකුණුම් වල ආයතනයේ නිලධාරීන්ගේ වැටුපෙන් අයකර ගන්නා තෙක් කරන ලද විකුණුම් සදහා වෙනම ණය ගැති ගිණුම් ඒ ඒ නිලධාරියා වෙනුවෙන් නිලධාරියාගේ නමින් පවත්වා ගත යුතුයි.

වී.ආර්. සිල්වා ආර්එස්පි යූඑස්පි එන්ඩියූ අයිජ්
මේජර් ජනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**වී.ආර්. සිල්වා ආර්එස්පි යූඑස්පි එන්ඩියූ අයිජ්**
**මේජර් ජෙනරාල්**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**